## ජීවිතයට දහම් සිසිල - 11

# දුරු නොකළ ක්‍රෝධය නිසා ප්‍රේතයන් ලෙස උපදිනවා

**සාකච්ඡා කෙළේ - තනූජා ධර්මපාල**

අප ගිය සතියේ සාකච්ඡා කෙළේ කෝපය පිළිබඳ ව. බුදුරජාණන්වහන්සේ දේශනා කළ කෝධන සූත්‍රයෙනුත් අපට මේ පිළිබඳ බොහෝ කරුණු සපයා ගත හැකි යි.

තමා, කෝපයෙන් පසුවන්නාට උගත් බව ලැබෙනවාට අකැමැති මානසිකත්වයක් පුද්ගලයන් තුළ ඇති වන බව අප ගියවර සඳහන් කළා. මෙසේ අනෙකා දියුණු වනවාට, උගතකු බවට පත්වනවාට අකැමැතිවන්නාට සිදු වන්නේ කුමක්ද? ඔහු නිසැකව ම වැරැදි දේ අරගෙන මා හරි දේ අල්ලා ගත්තා යැයි සිතා ගන්නවා. හරි දේ අල්ලගෙන එය වැරැද්ද යැයි සිතා අත අරිනවා. වැරැදි දැනුමක් මතයක් සමඟ ම යි එවැනි පුද්ගලයකු නිරන්තරයෙන් ම රැඳෙන්නේ.


ක්‍රෝධ චිත්තය දිගින් දිගට ම පුරුදු කළ පුද්ගලයාට ධර්මය අධර්මයෙන් වෙන් කොට හඳුනා ගැනීමේ හැකියාව ක්ෂය වී යනවා.

ඒ වාගේ ම තමන් තරහින් පසුවන පුද්ගලයාට කිසියම්ම හෝ යහපතක් නොවේවා යන පැතුම හදවතේ හැමවිට ම රඳවා ගෙන සිටින්නටත් පුද්ගලයන් පුරුදුව සිටිනවා නේද? කිසියම්ම විටක එවැනි පුද්ගලයකුට යහපතක් සිදුවුවහොත් ක්‍රෝධ සිතින් මැඩී සිටින්නා මහත් පීඩාවකට පත් වෙනවා. තරහින් දැවෙන්නට පටන් ගන්නවා. ක්‍රෝධ චිත්තය නිසයි එසේ වන්නේ.

දැන් බලන්න තමා ගේ සිත තුළ තරහක් ඇති වූ විට එය අකුසලයක් වශයෙන් හඳුනා ගෙන ප්‍රහාණය කරන්නට සිතන්නේ කීයෙන් කීදෙනා ද? එය අකුසලයක් කියාවත් හඳුනා ගැනීමට සමතුන් කෙතරම් අඩු ද?

ඇත්ත වශයෙන් ම බුදුරජාණන්වහන්සේ ගේ ධර්මය මිනිසුන්ට හරිහැටියට අසන්නට ලැබුණා නම් මෙවැනි තත්ත්ව ඇති වන්නේ නැහැ. අවබෝධයෙන් තොර ජීවිතයකට මිනිසුන් යොමු වන්නේ නැහැ.

දුරු නොකළ ක්‍රෝධ චිත්තය හේතුවෙන් අපට ප්‍රේතයන්, තිරිසනුන් ලෙස උපදින්නට සිදුවන බව අපට අවබෝධ වන්නේ ධර්මය පිළිබඳ ඇතිවන වැටහීම නිසා ම යි.



මට මෙතැන දී බුද්ධ කාලීන සිදුවීමක් මතකයට නැගෙනවා. එකල බුදුරජාණන්වහන්සේ ආනන්ද හාමුදුරුවන් සමඟ චාරිකාවේ වඩිමින් සිටියා. එහි දී මේ දෙදෙනා නාදිකා කියන ගමට වැඩියා. ඒ ගමේ ලොකු ආපදාවක් වෙලා බොහෝ අය මියැදිලා. ඉතිං ආනන්ද හාමුදුරුවන්ට වුවමනා යි ඒ අය ;මාන මොන වගේ තැන්වල උපත ලැබුවාදැ යි දැන ගැනීමට. බුදුරජාණන්වහන්සේට මේ ගැන පිරිසිඳ දැන ගැනීමේ ඥානය තිබෙන නිසා ආනන්ද හාමුදුරුවන් එහි වාසය කළවුන්ගේ නම් ගම් කියමින් ඒ අය ගේ උපත ගැන ඇසුවා. ඒ බොහෝ අය හිටියේ මාර්ග ඵලලාභීන් හැටියට යි. සකෘදගාමී පිරිස පනහකට වඩා හිටියා. පන්සියයකට වැඩි පිරිසක් සෝවාන් වූ අය. ඒ අය සියල්ලන්ගේ ම මරණින් මතු උපත සුගතගාමී යි. ඔවුන්ට දුක් සහගත උපතක් හිමිවන්නේ නැහැ. එසේ නම් ඔවුන් ගේ ජීවිත මෙසේ සැපවත් වීමට බලපෑ එක ම කරුණ කුමක් ද? ඔවුන් ගේ ජීවිතවලට ධර්මය ලැබීම ම නො වේ ද?


මොවුන් සියලු දෙනාගේ ම ජීවිත ගැන බුදුරජාණන්වහන්සේ සිය ඥාණයෙන් විමසා බලා පැහැදිලි ලෙස ම ප්‍රකාශ කළා ඔවුන් සැපවත් ජීවිත ලබා ඇති බව. දැන් බලන්න ධර්මය සහිත ලෝකයක ඇති රැකවරණය.

අද සමහර මහා ධනපතියන්ට පවා මරණයෙන් පසු සිදුවන්නේ කුමක් ද? ඒ අය ගේ සමහර ඥතීන් අප සමඟ පවසන කාරණා පුදුමාකාර යි. ඇත්තෙන් ම තමන්ම යි තමන් ගේ ජීවිතය විනාශය කරා පමුණුවා ගන්නේ. මේ තත්ත්වය මිනිසුන් තමන් ගේ ජීවිත කාලය ඇතුළත වටහා නොගැනීම මොන තරම් අවාසනාවක් ද? කිසියම් පුද්ගලයකු වෙත පවතින ඉතා වැදගත් ලක්ෂණයක් තමයි ධර්මය ඇසීමට ඇති කැමැත්ත. සුස්සූසති නමින් බුදුරජාණන්වහන්සේ හඳුන්වා දුන් මේ ලක්ෂණය මිනිස් ජීවිතයකට අන් හැම දෙයකට ම වඩා වටිනවා.

දැන් සමහරු කියනවා අප පිහිට පිණිස ගත යුත්තේ අප ගේ බුද්ධිය යි කියා. අප සරණ කර ගත යුත්තේ අපේ බුද්ධියලු. ඒත් අපේ බුද්ධිය කෙබඳු දෙයක් ද? අප නොදන්නවා වුණාට අපේ බුද්ධිය පවතින්නේ අවිද්‍යාත්මක චින්තනය මත යි. එය අපට පිහිට පිණිස නොපවතින්නේත් ඔය කාරණය නිසා ම යි. අපට මේ අවිද්‍යාව ප්‍රහාණය කළ බුද්ධියක පිහිට අවශ්‍යය යි. අන්න ඒ බුද්ධිය තමන් විසින් ම ලබා ගත් එක ම උත්තමයා අප ගේ තථාගතයන් වහන්සේ යි. ඒ බුද්ධියේ පිළිසරණ පැතීම අපට අවශ්‍ය වන්නේ ඒ නිස යි.

විවිධ අඥන මත හා දෘෂ්ටි සරණ ගොසින් ධර්මය වෙනස් කිරීමට උත්සාහ දරන්නන්ට හිමි දුක ම යි. මේ නිසා මෙවැනි පුද්ගලයන් ගේ මතිමතාන්තරවලට ගොදුරු වී ඔබත් පිරිහෙන්නට සිතන්නට එපා.

ඉතිං අපට ඉතා පැහැදිලියි ක්‍රෝධයට, බද්ධ වෛරයට හේතුව කිසි ම අවබෝධයකින් තොර ව භෞතික දේ පිළිබඳ ඇති වන කැමැත්ත සහ ඒවා හිමි කර ගැනීමේ නොතිත් ආශාව බව. යමක් තමා සතු කර ගැනීමේ ඉලක්කයෙන් මෙහෙයවෙන පුද්ගලයා ඒ දැඩි ආශාවෙහි ගොදුරක් බවට පත් වූ විට ඔහුට එහි හරි වැරැද්ද නොපෙනී යනවා. ඔහුට තම ඉලක්කයට බාධක ලෙස පවතින සියල්ල වනසා දැමීමට අවශ්‍යය යි. පුද්ගලයකු ගේ මානසිකත්වය මේ තත්ත්වයට පත් වූ විට ඔහු ඉතා සූක්ෂම ආකාරයට මේ බාධා දුරුකර දැමීමට සැලසුම් කිරීමට පටන් ගන්නවා. ඇතැම්විට නොනිදා සිය මුළු කාලය ම මේ ඉලක්කය සපුරා ගැනීමට කැප කරනවා. මෙය ක්ෂණික කෝපය නම් නො වේ.




බුදුරජාණන්වහන්සේ මේ තත්ත්වය විග්‍රහ කොට වදාළේ මෙහෙමයි. 'රෑට දුම් දමනවා, දවාලට ගිනි ගන්නවා' රෑ තිස්සේ ම කල්පනාව. චේතනාත්මක ව තමා සිදු කිරීමට සූදානම් වන අකුසලය සැලසුම් කරනවා. දැන් මේ පුද්ගලයා ගේ සිහි නුවණ සම්පූර්ණයෙන් ම වෙනස්. විකෘති යි. දැන් ඔන්න යම් යම් සැලසුම් මේ කෙනා ගේ ඔලුවට එනවා. ඒ මොහොතේ පටන් ම ඔහුට විශ්වාසයි මේ සැලසුම තමයි එක ම විසඳුම කියා. ඉන්පසු ව ඒ සැලසුම ක්‍රියාත්මක කරනවා. මේ ක්‍රියාව නිසා පසුවට කුමක් සිදුවේවි ද යන වග ගැන කිසි ම වැටහීමක් හෝ කල්පනාවක් නැහැ. මෙයින් මට ඇති වන බලපෑම මොකක් ද මෙය අත්හැර දැමුවහොත් වඩා යහපත් නොවේ ද ආදි ලෙස සිය කල්පනාව මෙහෙයවන්නට ඔහුට සිතෙන්නේ නැහැ.

ඔහු ගේ සැලසුම කෙනකු මරා දැමීම නම්, තමාට එය කළ නොහැකි බව වැටහුණු පසු එය වෙනත් අයකු ලවා හෝ කරවන්නට ඔහු පෙළඹෙනවා. තමාගේ ක්‍රියාව පිළිබඳ කිසිදු විමසා බැලීමක් නැහැ. මෙතැන් පටන් ම ඔහු ගේ විනාශය ඇරඹෙනවා. අනුන් විනාශ කොට තමනුත් විනාශ වීම පටන් ගැනෙනවා.

දැන් බලන්න මේ කෝපය, ක්‍රෝධය වැනි හැඟීම් මොන තරම් පුදුමාකාර තරමට පුද්ගලයා වසඟ කර ගන්නවා ද? මේ හේතුවෙන් සමහර පවුල්වල මාපියන් දරුවන් ගේ පවුල් අවුල් කර දමන්නට පවා මූලික වී කටයුතු කරනවා අප දැක තිබෙනවා නේ ද? ඇතැම් පවුල්වල විවාපත් යුවළක් වෙන්වන තුරු ම අම්මා හෝ තාත්තා ඒ පවුලට බලපෑම් කරන්නේ නැත් ද? බැලූ බැල්මට පුදුමාකාර ලෙස පෙනෙන මෙවැනි සිදුවීම් පසුබිමේ පවතින්නේ කෝපය සහ ක්‍රෝධය යි.

සමහර ගුරුවරු තම ගෝලයන් හොඳ අධ්‍යාපනයක් ලබනවාට අකැමැති ව තරහ සිත් ඇති කර ගන්නවා. ඒ සිත දිගින් දිගට ම පවත්වා ගන්නවා. හැබැයි ඉතිං මේ හේතුව නිසා ම ගුරුවරයාට කිසි ම දක ධර්මාවබෝධය නම් හිමිවන්නේ නැහැ. එය ඉතා පැහැදිලි යි.

අනුන් ගේ දියුණුව අනුමෝදන් විය නොහැකි, ඒ දියුණුව දෙස බලා සතුටු විය නොහැකි මානසිකත්වයක පදනම ද්වේෂය යි. තමාට වැඩි කුසලතා ඇති ගෝලයා සමඟ ගුරුවරයා කිපෙන්නේත්, දරුවන් ගේ විවාහ ජීවිතවල සතුට ඉවසිය නොහැකි මාපියන් දැකගත හැක්කේත් මේ හේතුවෙන් ම යි.

මෙවැනි පුද්ගලයන්ට මේ කර්මවල විපාක වශයෙන් නියත ලෙස ම සිදුවන යමක් පිළිබඳව බුදුරජාණන්වහන්සේ දේශනා කොට වදාළා. එනම් මෙවැනි අය ගේ දේපළ කිසියම් ම හෝ හේතුවකින් විනාශ ව යෑම යි. මිනිසා පිරිහෙන්නේ කෙලෙස් නිසා ම යි.

මේ බුද්ධ දේශනා ඉතා ම පැහැදිලියි. සත්ත්වයා පිරිහෙන්නේ සිත පිරිහීමෙන්. එහෙම නම් සත්ත්වයා, දියුණු වන්නේ කොහොම ද? සිත දියුණු වීමෙන් ම යි.

ඒ නිසා ඔබ තදින් ම සිතේ සනිටුහන් කර ගන්නට අමතක කරන්නට එපා, පුද්ගලයකු ගේ දියුණුව මැන ගැනීමේ සාධකය ඔහු ගමන් ගන්නා වාහනය, උගත් බව, දැනුම, රූපය, දේපළ, ශරීර ශක්තිය ආදී කිසිවක් ම නො වේ. ඔහු වෙත පවතින ගුණ ධර්ම ම යි.

මේනිසා ම තමයි මේ ධර්මය මෙලොව පවතින අන් සියලු දෙයින් ම වෙනස් වන්නේත්. ධර්ම මාර්ගයේ ඉහළම තක්සේරුව ලැබෙන්නේ ගුණදහම්වලට යි.

දැන් අප දැක තිබෙනවා නේද ඇතැම් පුද්ගලයන් මුළු ජීවිත කාලයක් හරි හම්බ කරගත් දේ කුමක් හෝ හේතුවකින් විනාශ වී යනවා. මෙසේ සිදුවීමට පැහැදිලි හේතු තිබෙන බව ඔබට දැන් වැටහෙනවා ඇති.

ඊළඟ කාරණාව තමයි තමන් තරහින් පසුවන පුද්ගලයා ගැන කීර්ති ප්‍රශංසා පැතිර යනවාට කෙනකු තුළ ඇතිවන නොකැමැත්ත. ක්‍රෝධයෙන් මඩනා ලද සිත් ඇත්තාට අවශ්‍යයි අදාළ පුද්ගලයා පිළිබඳ නින්දා අපහාස ප්‍රචලිත වෙනවා දකින්නට. මේ විදියට යම් පුද්ගලයකු ගැන කීර්ති රාවයක් පැතිර යන අවස්ථාවල දී ක්‍රෝධයෙන් වැසී සිටින පුද්ගලයා සිතාමතා ම ඒ පුද්ගලයා ගැන අපහාසාත්මක කතා පැතිරවීමට පෙළඹෙනවා. ඒ කීර්තියට ඔරොත්තු දීමේ හැකියාව ඇති සිතක් ඔහුට නැහැ.

මෙහි විපාක මීළඟට බුදුරජාණන්වහන්සේ දේශනා කළා. මෙවැනි පුද්ගලයකුට මේවායේ විපාක වශයෙන් සිදුවන්නේ කුමක් ද? මේ පුද්ගලයා සතු ව කිසියම් ම හෝ කීර්ති නාමයක් ඇත්නම් නියත ලෙස ම ඒ රාවය ඔහු කෙරෙන් දුරු වී යනවා.

තමා ක්‍රෝධ සිතින් පසුවන පුද්ගලයකු තනිවනවා දැකීමටත් මිනිසුන් ඉතා කැමැතියි නේ ද? එවන් පුද්ගලයකු තනිවේවා යි, කාත් කවුරුවත් නොමැති වේවා යැයි පතන අය කෙතරම් ද? මේවා සිතින් සිතා නිහඬ නො වී වචනයෙන් කියමින් ප්‍රාර්-

ඨනා කරනා අය ඔබ දැක තිබෙනවා නේද? ඔය මනුස්සයාට වතුර උගුරක් දෙන්න කෙනෙක් නැති වේවි' ආදී වශයෙන් සමහරුන් කියන්නේ නැත් ද? ඒ වචන කියනා පුද්ගලයකු ගේ අභ්‍යන්තර චිත්තයේ පවතින ස්වභාවය කුමක් ද? ක්‍රෝධය යි. නො එසේ නම්, එසේ සිදුවනවාට ඇති බලවත් කැමැත්ත යි. ඔහු මෙවැනි අනාවැකි පවසමින් සතුටුවන්නේ ඒ නිසයි.

මහි විපාකය ඔබ දන්නවාද? මේ පුද්ගලයාට නියත ලෙස ම තනිවන්නට සිදුවනවා. අනුන්ට සිදුවනවාට කැමැති වන්නා වූ දේ ම තමාට සිදුවනු නියත බැව් බුද්ධ දේශනාවේ සඳහන්.

අන් අය ගේ පිරිහීම පැතීම නිසා පිරිහෙන්නේ තමා ම යි.

දැන් සමහරුන්ට විශාල ප්‍රශ්නයක් තමන් දැඩි සේ ආශා කරන යමක් ලබා ගැනීමට නොහැකි වීම. ඒ නිසයි විශාල අකුසල් රැස් කර ගෙන ඒ වෙතට යන මාවත සකසා ගැනීමට වෙහෙස දරන්නේ. තමන් ආශා කරන දේ පිළිබඳ ඇල්ම තම සිතින් ඉවත් කර ගැනීමට උත්සාහ දැරීමටවත් බොහෝ අය අකැමැති යි. එහෙත් කෝපය සන්සිඳුවා ගැනීමේ මඟත් එයමයි. ඒ වාගේ ම මේ නිසා තමන් යොමු වන අකුසලින් පිරි මාවත ගමන් ගැනීමෙන් තමාටත්, අනුන්ටත් අයහපතක් ම සිදුවන බව වටහා ගැනීමට ඒ පුද්ගලයාට යම් මොහොතක හැකියාව ලැබෙනවා නම්, එතැනින් ම ඒ අර්බුදය නිමා වී යනවා.

මෑත කාලීන ව හොඳ උදාහරණයක් මං ඉදිරිපත් කරන්නම් මේ සම්බන්ධ ව. ඔන්න ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලිය ආවානේ මෑතක දී. එතන දී අපේ රටේ ක්‍රිකට් ලෝලීන්ට මොකද වුණේ? ඒ අය උදේ හවා පැතුවේ අපට ලෝක කුසලානය ලැබෙන්නයි කියලා නේ. ඒ අතර ඕස්ට්‍රේලියානු කණ්ඩායමේ පරාජයත් ඒ වාගේ ම ප්‍රාර්ථනා කළා නේ. ඒ හැඟීමෙන් මැඬී මොකද කෙළේ? ළාමක ගීත හදන්න ගත්තනෙ ඒ කණ්ඩායම ගැන. මාධ්‍යවලින් ගීත ගායනා කළා ඕස්ට්‍රේලියානු කණ්ඩායමේ ක්‍රීඩකයන් ගේ නම් ගම්වලට විහිළු තහළු අපහාස වන පරිදි. ඒ කියන්නේ අපි දිනුමක් පිළිබඳ ඇති දැඩි ආශාව අල්ලා ගෙන වෙනත් පිරිසක ගේ පරාජය පතාගෙන ඉන්නවා පිරිහුණ සිත් ඇති ව. මේක ක්‍රීඩාවට සම්බන්ධ ද? ඇත්තට ම ඒක කිසියම් විකෘතියක් නො වේ ද? ක්‍රීඩාවක සැබෑව නම් ජය පැරදුම දෙක ම සම සිතින් පිළිගැනීමට හැකියාව ඇති කර ගැනීම. ජයග්‍රහණය කරා අප යනවා නම් එය මධ්‍යස්ථ ව භුක්ති විඳින්නට තරම් ජනතාව බුද්ධිමත් වී සිටිය යුතුයි.

යමක් තමා සතුකර ගැනීමට සිතක බල පැවැත්වෙන සිතිවිලි පුදුමාකාර යි. අප නොසිතන ආකාරයට යි අපේ සිතිවිලි මෙහි දී ක්‍රියාත්මක වන්නේ. ධම්මපදයේ එක් සඳහනක් මං කියන්නම්. එක ගෙදරක ස්වාමියකු සහ බිරියක ජීවත් වුණා. බිරියට දරු සම්පතක් ලැබීමේ හැකියාව නැහැ. මේ අය නිතර කතා බහ කළා මේ දෙදෙනාගෙන් පසු ව ඒ අය ගේ දේපළවලට සිදුවන්නේ කුමක් ද කියා. අවසානයේ දී දෙදෙනා තීරණයකට ආවා සැමියා යළි විවාහ විය යුතු යි කියා. ඉන්දියාවේ බහුභාර්යා විවාහයට ඉඩකඩ තිබුණා. ඉතිං මේ සැමියා යළි බිරියක් සරණ පාවා ගත්තා. කෙසේ හෝ මේ දෙවැනි බිරියට දරුවකු ලැබීමේ සූදානමක් ඇති වුණා. එවිට ඈ තම ස්වාමියා ගේ පළමු බිරියට ඒ බව කියා සිටියා. මෙතෙක් මේ තත්ත්වයට කැමැති ව, එයට සූදානමින් සිටි නමුත් මේ පළමු බිරිය මේ ප්‍රවෘත්තියෙන් සසැළුණා. ඈ මෙසේ සිතන්නට පටන් ගත්තා.'මා සතු දේපළ මේ උපදින්නට ඉන්නා දරුවා සතු වන්නට යනවා.' ඔන්න ද්වේෂය හට ගත්තා. ඈට නොදැනිම මේ දේපළ පිළිබඳ ඇගේ සිතේ දැඩි ඇල්මක් පැවතී තිබෙනවා. කෙසේ හෝ ඈ මේ දරුවා මවුකුසේ දී ම මියැදෙන ආකාරයට කටයුතු කළා. දෙවැනි දරුවාටත් මේ ;ද් ම කළා. මෙහෙම වුණා ම දෙවැනි බිරිය, පළමුවැනි බිරිය හා වෛර බැඳ ගත්තා. ජාති ජාතිත් නුඹ පසුපස විත් පළිගන්නවා යැයි සිතක් ඇති කර ගත්තා. මේ වෛරය දිගින් දිගට ම ගියා බුද්ධ කාලය තෙක් ම.

බුද්ධ කාලයේ දී මේ දෙදෙනා කාන්තාවක් ව හා යක්ෂණියක් ව ඉපදී සිටියා. මේ කාන්තාව ගේ පළමුවැනි දරුවා යක්ෂණිය කෑවා. ඒ කියන්නේ යක්ෂණී ඇවිත් ගියා. ඒ සමඟ ම දරුවා මියැදුණා. දිනක් මේ මව සිය දෙවැනි දරුවා සැවැත් නුවර ගඟ අයිනේ නාවමින් සිටිද්දී යළි යක්ෂණිය පැමිණියා. ඒ මවු දරුවාත් රැගෙන බුදුරජාණන්වහන්සේ වෙත ගියා. උන්වහන්සේට දරුවා බාර කළා ආරක්ෂාවට. දැන් යක්ෂණිය ගේට්ටුව ළඟ. තථාගතයන් වහන්සේ යක්ෂණියට කතා කළා. මේ වෛරයේ ආරම්භය උන්වහන්සේ පෙන්වා දුන්නා. 'නහී වේරේන වේරානි' ආදි වශයෙන් දේශනා කරමින් වෛරය වෛරයෙන් නොසන්සිඳෙන බවත් එය සන්සිඳෙන්නේ අවෛරයෙන් ම පමණක් බවත් එය සනාතන ධර්මයක් බවත් පැහැදිලි කොට වදාළා.

**ලබන සතියේ කෝපය පාලනයට ක්‍රම හයක්**